ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
இலங்கைப் பாராளுமன்றம்
**Parliament of Sri Lanka**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## ANNUAL PERFORMANCE REPORT

## 2025

වැය ශීර්ෂය
தலைப்பு
**Head** **16**



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
இலங்கைப் பாராளுமன்றம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே
PARLIAMENT OF SRI LANKA, SRI JAYEWARDENEPURA KOTTE

**2025 සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

**වැය ශීර්ෂය 16**

**<u>අන්තර්ගතය</u>**


| | |
|---|---|
| **පරිච්ඡේදය 1 - ආයතනික පැතිකඩ** | **2** |
| **පරිච්ඡේදය 2 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | **7** |
| **පරිච්ඡේදය 3 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය** | **88** |
| **පරිච්ඡේදය 4 - කාර්ය සාධක දර්ශකය** | **89** |
| **පරිච්ඡේදය 5 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** | **91** |
| **පරිච්ඡේදය 6 - මානව සම්පත් පැතිකඩ** | **93** |
| **පරිච්ඡේදය 7 - අනුකූලතා වාර්තාව** | **94** |

## පරිච්ඡේදය - 01
## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

පාර්ලිමේන්තුව යනු විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය යන ප්‍රජාතන්ත්‍රවාදයේ කුළුණු තුනෙන් එකක් වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාදායකයයි. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ජනතාවගේ අභිලාෂයන් තහවුරු කිරීම, ඔවුන් නියෝජනය කිරීම , නීති සම්පාදනය කිරීම සහ රාජ්‍ය මුදල් පාලනය කිරීම සඳහා ප්‍රතිපාදන සලස්වයි.

ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය පිහිටා ඇත්තේ එහි ජනතාව වෙත වන අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(අ) ව්‍යවස්ථාවේ මහජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කළ යුත්තේ මහජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් බව සඳහන් කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62 වැනි ව්‍යවස්ථාවේ පාර්ලිමේන්තුවේ නියෝජිත බලය නිරූපණය වන අතර පාර්ලිමේන්තුවට පැවරී ඇති එම ව්‍යවස්ථාදායක බලය 75 වැනි ව්‍යවස්ථාවේ තවදුරටත් අවධාරණය කර ඇත. 76 වැනි ව්‍යවස්ථාවේ පාර්ලිමේන්තුව සතු අන්සතු කළ නොහැකි ව්‍යවස්ථාදායක බලය සහ නීති සම්පාදනයෙහිලා එය සතු වැදගත් කාර්යභාරය සඳහන් කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ කටයුතු නියාමනය කිරීම සඳහා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සඳහා බලය ලබා දී ඇත.

4(ඇ) ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, මුක්තිය සහ බලතල පිළිබඳ කාරණා සම්බන්ධයෙන් හැර ජනතාවගේ අධිකරණ බලය අධිකරණ හරහා පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුතු බව සඳහන් කරයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර ඇති පරිදි සහ 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත මඟින් පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරුන්ගේ සහ එහි මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, මුක්තිය සහ බලතලවල වැදගත්කම ද 67 වැනි වගන්තිය මගින් පිළිගනී. එවැනි වරප්‍රසාද, මුක්තිය සහ බලතල සුරක්ෂිත කිරීම ජනතාවගේ විධායක බලය ක්‍රියාත්මක කිරීම රටේ ජනාධිපතිවරයා වෙත පැවරී ඇති අතර 42 ව්‍යවස්ථාව මඟින් විධායකය පිළිබඳ අධීක්‍ෂණය පාර්ලිමේන්තුව විසින් තවදුරටත් නියම කර ඇති අතර අධීක්ෂණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාවර නියෝග මගින් පාර්ලිමේන්තුවට පහසුකම් සපයයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ පාර්ලිමේන්තුවට රාජ්‍ය මුදල් පිළිබඳ පූර්ණ පාලනය තිබිය යුතු බවයි.

2001 ජූනි 20 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී ලබා දුන් ඓතිහාසික තීන්දුවක් මගින්, එවකට කථානායක ගරු අනුර බණ්ඩාරනායක මහතා විසින් පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය යළි තහවුරු කළේය.

ශ්‍රී ලංකාව ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් වන අතර, ප්‍රජාතන්ත්‍රවාදය සහ තිරසරභාවය සඳහා වන එහි කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ව්‍යවස්ථාපිතව පිළිගත් කාර්ය මණ්ඩලයක් පාර්ලිමේන්තුවට සහාය දක්වයි. 2012 ඔක්තෝබර් 9 වැනි දින කථානායකවරයාගේ තීන්දුව මගින් කථානායක කාර්යාලය සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බලතල, අධිකාරිය සහ තරාතිරමෙන් සමාන කළ නොහැකි කාර්යාල දෙකක් ලෙස හඳුනාගෙන ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 (1) වැනි ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ මහ ලේකම් පත් කිරීම සඳහා විධිවිධාන සලසා ඇති අතර, 65 (3) ව්‍යවස්ථාව ප්‍රකාරව මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය කථානායකවරයාගේ අනුමැතිය ඇතිව මහ ලේකම්වරයා විසින් විසින් පත් කරනු ලබයි.

ලේකම් කාර්යාලය යනු රාජ්‍ය සේවයෙන් ස්වාධීන වන නිලධාරීන්ගෙන් සමන්විත වෘත්තීමය, පක්ෂග්‍රාහී නොවන සේවා ව්‍යුහයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වැනි ව්‍යවස්ථාව මගින් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය රාජ්‍ය නිලධාරීන් ගණයට අයත් නොවන නිලධාරීන් ලෙස අර්ථනිරූපණය කර ඇති අතර එමගින් ලේකම් කාර්යාලයට ස්වාධීන ආයතනයක් ලෙස විශේෂ පිළිගැනීමක් ලබා දී ඇත.

කාර්ය මණ්ඩලයට අදාළ කරුණු 1953 අංක 9 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනත මගින් නියාමනය කරනු ලබන අතර, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු සහ මූල්‍ය රෙගුලාසි සැකසීම සඳහා ප්‍රතිපාදන මෙම පනතින් සලසා ඇත. කාර්ය මණ්ඩලය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට උපදෙස් හා මඟ පෙන්වීම සඳහා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාවක් පිහිටුවීමට ද මෙම පනතෙන් විධිවිධාන සලසා ඇත.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් පාර්ලිමේන්තුවේ මහලේකම් කාර්යාලය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඔවුන්ගේ ව්‍යවස්ථාපිත ජනවරම ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි පිළිබඳ අවබෝධය මෙන්ම පර්යේෂණ, තාක්ෂණික සහ පරිපාලන සහාය ලබා දෙයි. පාර්ලිමේන්තුව මගින් ජනතා අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සහ ජනතාවට පාර්ලිමේන්තු පරිචයන් වඩාත් සමීප කිරීම සඳහා ලේකම් කාර්යාලය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. විශිෂ්ට සේවාවක් සැපයීමේ අරමුණින් 2025 වර්ෂයේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබූ විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ හැඳින්වීමක් මෙම වාර්තාවෙන් සැපයෙන අතර වැය ශීර්ෂ 16 යටතේ 2025 වර්ෂයට අදාළව සමස්ත මූල්‍ය කාර්ය සාධනය මේ තුළ අන්තර්ගත වේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර , අරමුණු

**දැක්ම**

ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය ප්‍රවර්ධනය කරන ඵලදායි හා කාර්යක්‍ෂම මහජන කේන්ද්‍රීය පාර්ලිමේන්තුවක් වීම.

**මෙහෙවර**

ව්‍යවස්ථා සම්පාදකයන්, ජනතා නියෝජිතයන් සහ රටෙහි මහජන මුදල් භාවිතය සියුම් ලෙස පිරික්සන්නන් ලෙස සිය කාර්යයන් සඵලදායී සහ වඩා කාර්යක්ෂම ලෙසින් ඉටු කිරීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට උපකාරී වන කාර්යය පටිපාටිමය උපදෙස් සහ පහසුකම් සැපයීම.

**පාර්ලිමේන්තුවේ ප්‍රධාන අරමුණු**

1. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීම
2. රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පූර්ණ පාලනය ක්‍රියාත්මක කිරීම
3. විධායකය සම්බන්ධයෙන් අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම

## 1.3 පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු

**වේත්‍රධාරී දෙපාර්තමේන්තුව**

වේත්‍රධාරීවරයා පාර්ලිමේන්තුවේ බලාධිකාරය සංකේතවත් කරන ''සෙංකෝලයේ'' භාරකාරිත්වය හොබවන අතර සභාව තුළදී මූලාසනය විසින් දෙනු ලබන නියෝගයන් ක්‍රියාත්මක කරනු ලබන නිලධාරියා ඔහුය. සභා ගර්භය තුළදී පාර්ලිමේන්තුවේ බල අධිකාරය සංකේතවත් කරන ''සෙංකෝලයේ'' භාරකාරත්වය සහ ආරක්ෂාව මෙන්ම කථානායකවරයාට සේවය ලබා දීම සහ සභාවේ විධායක අධිකාරය වන කථානායකවරයාට සේවය කිරීම තුළින් පැන නැගෙන අනෙකුත් කාර්යභාරයන් ඉටු කිරීම හා පාර්ලිමේන්තුව සහ කාරක සභා කාර්යක්ෂම අන්දමින් ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය කරන සහාය කාර්ය මණ්ඩලය සහ පහසුකම් ලැබෙන බව සහතික කිරීම තුළින් ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට සහය ලබා දීම වේත්‍රධාරී දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි.

පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ගේ හා කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ මෙන්ම අමුත්තන්ගේ ආරක්‍ෂාව තහවුරු කිරීම සඳහා සෘජුවම සම්බන්ධවන අංශයක් වන වේත්‍රධාරී දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තු සංකීර්ණයෙහි ආරක්ෂාව සහ සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කරනු ලබයි.

**පරිපාලන දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුවෙහි සියලුම පරිපාලන කටයුතු කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටු කිරීම සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයෙහි ඔවුන්ගේ පුද්ගල සංවර්ධනය හා යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරමින් අඛණ්ඩව තම කටයුතු පවත්වා ගෙන යාම පරිපාලන දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානතම කාර්ය භාරය වේ.

සීඝ්‍රයෙන් වෙනස්වන පරිසරයක් තුළ, මෙම උත්තරීතර ආයතනයෙහි අරමුණු හා අභියෝග සාර්ථක ලෙස සාක්ෂාත්කර ගැනීම සහ සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් කාර්යක්ෂමව කටයුතු කිරීම සඳහා සහ තීරණ උපාය මාර්ගික වශයෙන් ක්‍රියාත්මක කිරීම පිණිස නිවැරදි ආකල්ප හා දැනුම සහිත ක්‍රියාශීලී කාර්ය මණ්ඩලයක් අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සිය භාරධූර වගකීම් අවබෝධ කරගන්නා ලදුව, පරිපාලන දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයෙහි කාර්යසාධනය, අඛණ්ඩ සංවර්ධනය හා යහපැවැත්ම තහවුරු කිරීම වෙනුවෙන් ඉතා දැඩි සේ කැප වී සිටී. මෙම කාර්යය උදෙසා සාධනීය වෙනසක් ඇති කිරීම වෙනුවෙන් නිරන්තරයෙන් ප්‍රයත්න දරන අතර මානව සම්පත් කළමනාකරණයේදී නිවැරදි ප්‍රතිපත්ති, තීරණ හා ක්‍රියාමාර්ග මඟින් ආයතනය මෙහෙයවීම පිණිස, මානව සම්පත් ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා සැකසීමේ බලය පරිපාලන දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබ ඇත.

**ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුවේ නීති සම්පාදන ක්‍රියාවලියට සහායවීම, ව්‍යවස්ථාදායකයේ වැඩ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකිරීම, විධායකය විසින් පාර්ලිමේන්තුවට සහ මහජනතාවට තිබෙන වගකීම හා වගවීම සහතික කිරීම පිණිස විවිධ කාරක සභා මඟින් අධීක්ෂණය හා රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ වැඩ කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීම, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන්ට නීති සම්පාදකයින් වශයෙන් ඔවුන්ට අවශ්‍ය පර්යේෂණ සහ විවාද විෂය තොරතුරු පහසුකම් සැපයීම, ව්‍යවස්ථාදායක ක්‍රියාවලියේදී සන්ධාන භාෂාව සමඟ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, පනත් කෙටුම්පත්, නියෝග, නියමයන්, රීති, රෙගුලාසි යනාදී අනුනීති, ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික වාර්තා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත්පාලන ආයතනවල කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට පිළිගැන්වීම, ඒවා අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම, පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළ න්‍යාය පත්‍ර, න්‍යාය පුස්තක හෝ ඒ හා සම්බන්ධ පරිපූරක, කාර්ය සටහන්, දිනට නියමිත වැඩ පිළිවෙළ භාෂා ත්‍රිත්වයෙන් සකස් කිරීම යනාදියට අදාළ සියලු කාර්යයන්වලට සක්‍රීය දායකත්වය ලබාදීම ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

**මුදල් සහ සැපයුම් දෙපාර්තමේන්තුව**

මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තුවේ කළමනාකරණ කටයුතුවලදී ප්‍රධාන මෙහෙයක් ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂ (මුදල්), මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වේ. ගිණුම් නිලධාරි ලෙස අධ්‍යක්ෂ (මුදල්) විසින් මූල්‍ය කටයුතුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට සෘජුවම වාර්තා කිරීම සහ උපදෙස් දීම සිදු කරනු ලබයි.

ගිණුම් නිලධාරි වශයෙන් පැවරෙන සාමාන්‍ය වගකීම් ඉටු කිරීම සහ රජයේ මුදල් රෙගුලාසි, නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටීන්ට අනුව මුදල් කළමනාකරණය කිරීම තහවුරු කිරීම සඳහා මුදල් පාලක කාර්යයන් ඉටු කිරීම ද වත්කම්වල ආරක්ෂාව හා වත්කම්වල කාර්යක්ෂමභාවය සහතික කිරීම, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාවේ නැංවීමද අධ්‍යක්ෂ (මුදල්) යටතේ ඇති ප්‍රධාන කාර්ය භාරයන් වේ.

**හැන්සාඩ් දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන් විසින් සිදු කරනු ලබන සෑම කථාවක්ම අඩංගු ''හැන්සාඩ් වාර්තාව'' සකස් කිරීම සහ පාර්ලිමේන්තු කාරක සභා වාර්තා සටහන් සකස් කිරීම හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

හැන්සාඩ් සංස්කාරක, නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරකවරුන්, සහකාර හැන්සාඩ් සංස්කාරකවරුන්, ජ්‍යෙෂ්ඨ හැන්සාඩ් වාර්තාකරුවන් සහ හැන්සාඩ් වාර්තාකරුවන් යන නිලධාරින්ගෙන් සමන්විත මෙම දෙපාර්තමේන්තුව, කාරක සභා වාර්තාකරුවන්ගේ ඒකකයකින්ද, සූචි සම්පාදන ඒකකයකින් ද, කථා පටිගත කිරීමේ ඒකකයකින් ද සමන්විත ය.

පාර්ලිමේන්තු විවාද පැවැත්වෙන අතරතුර ප්‍රකාශ කරනු ලබන, ශ්‍රවණය වන සෑම වචනයක්ම හැන්සාඩ් වාර්තාකරුවන් විසින් වාර්තා කර ගෙන, ඔවුන් විසින් ඒවා අත් පිටපත් කර, එම පිටපත් පරීක්ෂා කර බලා දෝෂ තිබේ නම් නිවැරදි කිරීම සඳහා සහකාර හැන්සාඩ් සංස්කාරකවරුන් වෙත භාර දෙනු ලැබේ. එසේ නිවැරදි කරන ලද පිටපත්, ඉන්පසුව එක් එක් අංශයේ නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරක වෙත භාර දෙනු ලැබේ.

ඉන් අනතුරුව සිදු කෙරෙන සියලුම කටයුතු හැන්සාඩ් සංස්කාරක වෙත පැවරෙන අතර, මුද්‍රණය කර පළ කිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත යවනු ලබන අවසන් පිටපත සකස් කිරීමේ වගකීම හැන්සාඩ් සංස්කාරකට පැවරේ.

**සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තු සංකීර්ණයෙහි, කථානායකතුමාගේ නිල නිවසෙහි, ශ්‍රාවස්තියෙහි, මාදිවෙල හා ජයවඩනගම නිවාස සංකීර්ණයෙහි පිහිටි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හා කාර්ය මණ්ඩල නිල නිවාසවල සහ නුවරඑළියේ පිහිටි සෙන්පති නිවසෙහි අවශ්‍ය සියලුම සිවිල් නඩත්තු කටයුතු සඳහා 1990 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

විදුලි සෝපාන, ප්‍රධාන වායු සමීකරණ පද්ධතිය, සමීප රූප ආවේක්ෂණ කැමරා පද්ධතිය (සී. සී. ටී. වී.), ප්‍රධාන රූපවාහිනී ඇන්ටනා පද්ධතිය (එම්.ඒ ටී. වී), ශබ්ද පද්ධතිය, ශීත කාමර ආදී සියළුම සේවා සහ උපකරණ පද්ධතිවල මනා ක්‍රියාකාරිත්වය සහතික කිරීම සහ අනුබද්ධ දෙපාර්තමේන්තුවල නඩත්තු කටයුතු සම්බන්ධයෙන් වගකීම දැරීම (ලංකා විදුලි බල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය) මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදුවේ. පාර්ලිමේන්තු ගොඩනැගිල්ලෙහි අළුත්වැඩියා සහ පිළිසකර කටයුතු පිළිබඳව සැලකිලිමත් වීම සහ ගොඩනැගිලි සංකීර්ණයෙහි නව ඉදිකිරීම් සිදු කිරීම, නව ඉදිකිරීම් සඳහා මිල ගණන් කැඳවීමේ ලේඛන පිළියෙල කිරීම මෙන්ම විදුලි උපකරණ හා පද්ධති නඩත්තු කිරීම්හි අවශ්‍ය අළුත්වැඩියා කිරීම සිදු කරනු ලබයි.

**තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා පිළිබඳව වගකීම දරනු ලබන්නේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසිනි. තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව පිහිටුවනු ලබන්නේ 2004 වර්ෂයේ අග භාගයේදීය. නව තාක්‍ෂණය මුසුවුනු තොරතුරු පද්ධති මගින් පාර්ශ්වකරුවන් ශක්තිමත් කිරීම තම දැක්ම කර ගත් තොරතුරු පද්ධති හා කළමණාකරන දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තු ලේකම් කාර්යාලයේ කටයුතුවල කාර්යක්ෂමතාව හා ඵලදායීතාව උසස් මට්ටමකට ගෙන ඒම සඳහා වර්තමානයේදී සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. පාර්ලිමේන්තුවේදී ගනු ලබන තීරණ හා වැදගත් කාරණා සම්බන්ධ දැනුම සහ තොරතුරු මගින් පොදු ජනතාව සවිබලගැන්වීම හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට උපකාර කරනු වස්, ඔවුන්ට නිවැරදි සහ කාලෝචිත තොරතුරු කාර්යක්‍ෂමව සැපයීම මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදු කරනු ලබයි.

**ආහාරපාන හා ගෘහපාලන දෙපාර්තමේන්තුව**

1982 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නව පාර්ලිමේන්තු සංකීර්ණයෙහි ස්ථාපිත කිරීමත් සමගම ආහාරපාන හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවේ අළුත්ම දෙපාර්තමේන්තුවක් වශයෙන් බිහි වූයේ තරු පංතියේ හෝටල් ක්ෂේත්‍රයේ අන්තර්ජාතික ප්‍රමුඛ පෙළේ හෝටලයක් වූ ලංකා ඔබරෝයි හෝටලයේ තාක්ෂණික හා වෘත්තීයමය ප්‍රවීනත්ව මෙහෙයුම් හා උපදේශකත්වය යටතේය. පසු කලකදී මෙම දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවේ මහලේකම්ගේ කාර්ය මණ්ඩලයට අනුයුක්තව අද වන විට ක්‍රියාත්මකව පවතී.

මෙම අංශය ආහාර භෝජනාගාර හා ගෘහපාලන අධ්‍යක්ෂවරයෙකුගේ යටතට ගැනෙන අතර, මුළුතැන්ගෙය, භෝජනාගාර හා ගෘහපාලන වශයෙන් ප්‍රධාන උප අංශ  තුනක් යටතේ ක්‍රියාත්මක වෙයි.

ප්‍රධාන වශයෙන් ආහාරපාන භෝජනාගාර සේවා අංශ 12කින් සමන්විත වන අතර ආපනශාලා, විධායක භෝජනාගාර, ආහාර හා සැපයුම් අංශය, ප්‍රභූ භෝජනාගාර වශයෙන් සංවිධිත වන අතර ඉන් 5ක් දිනපතාම ක්‍රියාත්මකතාවයේ පවතිමින් පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දින හැරුණු කොට දිනකට පුද්ගලයින් 1000 – 1200 අතර ප්‍රමාණයකට පහසුකම් සපයනු ලබයි.

දෙපාර්තමේන්තුවේ තවත් ප්‍රධාන රාජකාරියක් වන්නේ, මහල් 5 කින් සමන්විතවන සම්පූර්ණ ගොඩනැගිල්ලේත්, සුවිශේෂී ප්‍රභූන්ගේ අවශ්‍යතාවයන් පරිදි ඉතාමත් උසස් තත්ත්වයේ සනීපාරක්ෂක කටයුතු මෙන්ම ගෘහ පාලන කටයුතු මෙහෙයවා ගැනීමයි. එමෙන්ම රාජකාරි මට්ටමෙන්ද වෘත්තීය මට්ටමෙන්ද පාර්ලිමේන්තු පරිශ්‍රය  පරිහරණය කරන සෑම සියළු දෙනාටම යෝග්‍ය පරිදි ගෘහ පාලන සේවාව මැනවින් පවත්වා ගැනීමයි.

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**

මහජනතාව වෙත තොරතුරු ගෙන යන පාර්ශවකරුවන්හට අදාළ තොරතුරු ලබා ගත හැකි කාර්යක්ෂම මහජන කේන්ද්‍රීය පාර්ලිමේන්තුවක් දක්වා වත්මන් පාර්ලිමේන්තුව වර්ධනය කිරීම උදෙසා සන්නිවේදන දෙපාර්තමේන්තුව 2019 වර්ෂයේ පිහිටුවා ඇත. අධ්‍යක්ෂ (සන්නිවේදන) විසින් මෙහෙයවනු ලබන  මෙම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙන්ම පුරවැසියන්, මාධ්‍ය, සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා කණ්ඩායම් අතර අන්තර් ක්‍රියාකාරිත්වයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම තම දැක්ම කර ගෙන ඇත. මෙම දෙපාර්තමේන්තුව යටතේ මාධ්‍ය අංශය හා මහජන සේවා ලෙස අංශ දෙකක් යටතේ කළමනාකරුවන් දෙදෙනෙකු යටතේ ක්‍රියාත්මක වේ.

පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සන්නිවේදනයන් කළමනාකරණය කිරීම, සන්නිවේදන උපාය මාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, සහ සියලුම සන්නිවේදන සැලසුම්  සකස් කිරීම සිදු කරයි. ව්‍යාපෘති කළමනාකරණය, සංස්කරණය කිරීම මාධ්‍ය අංශය විසින් සිදු කරනු ලබන අතර මහජනතාව සහ පාර්ලිමේන්තුව අතර මනා සහ සම්බන්ධතාවක් පවත්වාගෙන යාම සහ විවෘත මහජන සහභාගිත්වයක් සඳහා පහසුකම් සැපයීම මහජන සේවා අංශය මගින් සිදු කරනු ලබයි.

**1.4 සංවිධාන ව්‍යූහය**

ගරු කථානායකතුමා ප්‍රමුඛත්වය දරන පාර්ලිමේන්තුවේ රාජකාරි කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ලේකම් සහ කාර්ය මණ්ඩල සේවාවන් සැපයීම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. **(සංවිධාන ව්‍යූහය සඳහා කරුණාකර ඇමුණුම 01 බලන්න)**

**පරිච්ඡේදය - 02**
**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ **පාර්ලිමේන්තුව** යනු ජනතාවගේ පරමාධිපත්‍යය බලය නිරූපණය වන ප්‍රධානතම ආයතනයයි. රටක ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කිරීම උදෙසා පාර්ලිමේන්තුවෙන් ඉටුවන ප්‍රධාන කාර්යභාරය ඉතා සුවිශේෂී වෙයි. එය මහජන නියෝජනය (Representation), නීති සම්පාදනය (Legislation), විධායකය අධීක්ෂණය සහ වගවීම (Oversight and Accountability) සහ මූල්‍ය පාලනය (Financial scrutiny)ලෙස මූලික වශයෙන් දැක්වුවද ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක් මෙහෙයවීමේ මූලික කාර්යභාරය සහ වගකීම පාර්ලිමේන්තුව සතු යි. රාජ්‍ය මූල්‍ය පාලනය වඩාත් ක්‍රමවත්ව පවත්වා ගනිමින්, නීති සම්පාදනය කිරීමේ කාර්යයේ නිරත වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, වර්තමානයේදී මින් කවරදාටත් වඩා ශ්‍රී ලාංකික පුරවැසියා වෙත වඩවඩාත් සමීප වෙමින් කටයුතු කරමින් සිටියි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, දකුණු ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුවලින් එකකි. එනිසාම ඒ තුළ පුද්ගල නිදහස, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ පුරවැසි වගකීම පිළිබඳ ව වඩාත් අර්ථවත් දැක්මක් මෙන්ම දැනුම්වත් වීමක් අත්‍යවශ්‍ය වන වකවානුවක් උදාවී තිබේ. උක්ත අභිමතාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව 2025 වර්ෂය තුළ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය තුළදී මෙන්ම පාර්ලිමේන්තු ක්‍රමවේද සහ ක්‍රියාපටිපාටි පිළිබඳ මෙරට මහජනතාව දැනුම්වත් කරමින් විවිධ ක්‍රමවේද සහ පීඨිකාවන් ඔස්සේද මෙරට මහජනතාවට වඩාත් ඵලදායීව සමීප වීමට කටයුතු කොට තිබේ.

පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති ප්‍රමුඛතම ව්‍යවස්ථාදායක කාර්යභාරය වන නීති සම්පාදනයට අදාළ ක්‍රියාපටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුව ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය කටයුතු 2025 වර්ෂය තුළදී සිදුකොට තිබේ. ඒ අනුව, 2025 වර්ෂය තුළදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ රජයේ පනත් කෙටුම්පත් සංඛ්‍යාව 26 ක් වන අතර ඒ සියල්ලටම ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කොට තිබේ.

මෙරට නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත්ම අංගය වන්නේ මහජන නියෝජිතයන් විසින් සිය මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ රැස්වීම් වලට සහභාගී වීමයි. ඒ අනුව, 2025 වර්ෂයේ තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම් දින 111 ක් පවත්වා ඇත. ඒ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළව ඉදිරියේදී ඉදිරිපත් කිරීමට/ විමසීමට අපේක්ෂිත යෝජනා සහ ප්‍රශ්න ඇතුළත් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තක 02 ක් හා ඒ හා සම්බන්ධ පරිපූරක 38 ක්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් සභා ලේඛන කාර්යාංශය විසින් සකස් කරනු ලැබ රජයේ මුද්‍රණාලයේ සහාය ඇතිව මුද්‍රණය කිරීමෙන් අනතුරුව එම මුද්‍රිත ලේඛන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට, අමාත්‍යාංශ ලේකම්වරයන්ට, අදාළ ව්‍යවස්ථාපිත ආයතනවලට, මාධ්‍ය ආයතනවලට සහ පාර්ලිමේන්තුවේ හා අදාළ අනෙකුත් ආයතනවල ප්‍රධානීන්ට හා අදාළ වෙනත් නිලධාරින්ට දේශීය අධිවේගී තැපැල් සේවය මඟින් බෙදාහැරීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත.

එමෙන්ම, 2025 වර්ෂය තුළ අමාත්‍යාංශ, ඒවා යටතට ගැනෙන දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළව ඒ ඒ අමාත්‍යාංශවලින් යොමු කරනු ලබන කාර්ය සාධන සහ වාර්ෂික වාර්තා 451 ක්, විවිධ අණ පනත් යටතේ ඉදිරිපත් කරනු ලැබ අති විශේෂ ගැසට් පත්‍රවල පළ කරන ලද නියෝග, රෙගුලාසි සහ නියමයන් අඩංගු යෝජනා ද, යෝජනා සම්මතයන් ද ඇතුළත් අනු නීති (Subordinate Legislation) පාර්ලිමේන්තුවට පිළිගැන්වීමට කටයුතු කර ඇත.

පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන් විසින් තත්කාලීනව වැදගත් වන ගැටළු වලට අදාළව පාර්ලිමේන්තුව තුළ ඉදිරිපත් කරන ප්‍රශ්න ඉතා වැදගත් වේ. ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් භාර දෙන ලද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 728 ක් ද වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න 45 ක් ද ලියාපදිංචි කරන ලදුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව සංස්කරණය කර, අදාළ පරිදි අනෙකුත් භාෂාවන්ට (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) පරිවර්තනය කරවා ගැනීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට හෝ අදාළ පරිදි න්‍යාය පුස්තක හා සම්බන්ධ පරිපූරකවලට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, අමාත්‍යාංශයන්ට, අනෙකුත් ආයතනයන්ට, මාධ්‍යයට සහ මහජනතාවට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ විස්තර කඩිනමින් ලබා ගැනීමට හැකිවන පරිදි පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තක, නායය පුස්තකය හා සම්බන්ධ පරිපූරක, පාර්ලිමේන්තුවේ රැස්වීම් වෙනුවෙන් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍ර සහ කාර්ය සටහන්ද, පාර්ලිමේන්තුවේ ඉදිරි රැස්වීම් දිනයන් සඳහා නියමිත සභාවේ වැඩකටයුතු පිළිබඳ තොරතුරු ද සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් සකස් කර පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවියේ ඉතා යුහුසුළුව යාවත්කාලීන කිරීමට කටයුතු කොට තිබේ. එයට අමතරව, 2025 වර්ෂය තුළ පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වීමේදී සභාගත කරනු ලබන විවිධ රාජ්‍ය ආයතන මඟින් නිකුත් කරන ලද වාර්ෂික වාර්තා, වාර්ෂික කාර්ය සාධන වාර්තා සහ ගිණුම් වාර්තාද මෘදු පිටපත් ආකාරයෙන් වෙබ් අඩවියට උඩුගත කොට තිබේ.

පාර්ලිමේන්තු සම්ප්‍රදාය, ක්‍රියා පටිපාටි සහ එහි නූතන ප්‍රවණතා පිළිබඳ ව මනා අවබෝධය යන්න රටක ප්‍රජාව සතු වන පුරවැසි වගකීමක් වේ. එනිසාම, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වඩාත් මහජන කේන්ද්‍රීය ආයතනයක් බවට පත් කිරීම උදෙසා ම පිහිටුවන ලද සන්නිවේදන දෙපාර්තමේන්තුව මඟින්, 2025 වර්ෂය තුළ පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳ කාලීන සහ නිවැරදිව තොරතුරු ජනතාව අතරට ගෙනයෑම සඳහා විවිධ අයුරින් කටයුතු කොට තිබේ. ඒ් අනුව, 2025 වර්ෂය තුළ පාර්ලිමේන්තුවේ විවිධ කටයුතු සම්බන්ධව භාෂාත්‍රයෙන්ම මාධ්‍ය වෙත නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන සංඛ්‍යාව 450කට අධිකය. ඒවාට සමගාමීව පාර්ලිමේන්තුවේ නිල සමාජ මාධ්‍ය පිටු යාවත්කාලීන කොට තිබේ. එමෙන්ම, පාර්ලිමේන්තුවේ රැස්වීම් සජීවීව විකාශය කිරීම, පාර්ලිමේන්තුව පිළිබඳ ජනතාව දැනුවත් කිරීම පිණිස විවිධ ශ්‍රව්‍ය දෘෂ්‍ය නිර්මාණය සකස් කිරීම, පාර්ලිමේන්තුවේ විවිධ කාර්යයන් සහ වැඩසටහන් පිළිබඳ මාධ්‍ය සම්බන්ධීකරණය කිරීම සිදු කොට තිබේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පැමිණෙන රාජ්‍ය තාන්ත්‍රිකයන් , සුවිශේෂී පුද්ගලයන් ඇතුළු සියලුම අමුත්තන් පිළිගැනීම, දැනුවත් කිරීම සහ පාර්ලිමේන්තුව පිළිබඳ නිසි අවබෝධයක් ලබා දීම පාර්ලිමේන්තුවේ සුවිශේෂී කාර්යභාරයක් වෙයි. ඒ අනුව 2025 වර්ෂය තුළ පාර්ලිමේන්තුවට පැමිණ ඇති නරඹන්නන් 117,352 ක් සඳහා පහසුකම් සපයා ඇති අතර, ලංකාවේ සියලු පළාත් නියෝජනය වන පරිදි පාසල් 900ක සිසුන් ද ඊට ඇතුළත්ය. එමෙන්ම, පාර්ලිමේන්තු ක්‍රමය සහ පාර්ලිමේන්තු ක්‍රියාපටිපාටි පිළිබඳව මහජනතාව, විශ්ව විද්‍යාල ප්‍රජාව, පාසල් ප්‍රජාව සහ අනෙකුත් ආයතන වෙතට ගොස් දැනුම්වත් කිරීමද පසුගිය වසර තුළදී සිදුකොට තිබේ. ඒ අනුව, පාර්ලිමේන්තුව දැනුවත් කිරීමේ වැඩසටහන් 34ක් සහ ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන් 27ක් පවත්වා තිබේ.

පාර්ලිමේන්තුවේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සහ විනිවිදභාවයෙන් යුක්තව පවත්වා ගැනීම සඳහා පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයට අයත් වේත්‍රධාරී දෙපාර්තමේන්තුව, පරිපාලන දෙපාර්තමේන්තුව,ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව, මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව, හැන්සාඩ් දෙපාර්තමේන්තුව, ආහාරපාන සහ ගෘහපාලන දෙපාර්තමේන්තුව, සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව, තොරතුරු පද්ධති සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ සන්නිවේදන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු මහඟු කාර්යයක් ඉටු කරනු ලබයි.

කුෂානි රෝහණදීර
පාර්ලිමේන්තුවේ මහ ලේකම්



CamScanner

පාර්ලිමේන්තු මහලේකම්ගේ කාර්යාලයට අයත් දෙපාර්තමේන්තු විසින් 2025 වර්ෂයේ ඉටු කරනු ලැබූ කාර්යයන්ගේ ප්‍රගතිය පහත පරිදි වේ.

## ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව

නීති සම්පාදනය හා මහජන මුදල් භාවිතය අධීක්ෂණය කිරීම යන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීමය සේවාවන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත සපයයි.

පහත සඳහන් කාර්යාංශ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ. එනම්

1. සභා ලේඛන කාර්යාංශය
2. පනත් කෙටුම්පත් කාර්යාංශය
3. කාරක සභා කාර්යාංශය II - අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කාර්යාංශය
4. කාරක සභා කාර්යාංශය I
5. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශය
6. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාංශය
7. ආංශික අධීක්ෂණ කාරක සභා කාර්යාංශය
8. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශය
9. කථා පරිවර්තක කාර්යාලය
10. පුස්තකාලය

එම එක් එක් කාර්යාංශය විසින් 2025 වර්ෂයේ ඉටු කරන ලද කාර්යයන්හි කාර්ය සාධනය පහතින් දක්වා ඇත.

### සභා ලේඛන කාර්යාංශය

#### මෙහෙවර

පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට අදාළ සභාවේ සියලු වැඩකටයුතු කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය සහාය ලබා දීම.

#### ප්‍රධාන රාජකාරි

(1) 2025 වර්ෂයේ පවත්වන ලද පාර්ලිමේන්තුවේ රැස්වීම් දින 111ක් වෙනුවෙන් පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළව ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත යෝජනා සහ ප්‍රශ්න ඇතුළත් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තක 02ක් හා ඒ හා සම්බන්ධ පරිපූරක 38ක්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් සභා ලේඛන කාර්යාංශය විසින් සකස් කරනු ලැබ රජයේ මුද්‍රණාලයේ සහාය ඇතිව මුද්‍රණය කිරීමෙන් අනතුරුව එම මුද්‍රිත ලේඛන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට, අමාත්‍යාංශ ලේකම්වරයන්ට, අදාළ ව්‍යවස්ථාපිත ආයතනවලට, මාධ්‍ය ආයතනවලට සහ පාර්ලිමේන්තුවේ හා අදාළ අනෙකුත් ආයතනවල ප්‍රධානීන්ට හා අදාළ වෙනත් නිලධාරින්ට දේශීය අධිවේගී තැපැල් සේවය මඟින් බෙදාහැරීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත.

ඊට අමතරව එළඹෙන රැස්වීම් දිනයේ දී එකී ලේඛන සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ ම සභා මේසය මත තැබීමටත්, පාර්ලිමේන්තුවේ අනෙකුත් අදාළ අංශ වෙත ඒවා බෙදාහැරීමටත් කටයුතු කර ඇත.

(2) 2025 වර්ෂයේ පවත්වන ලද පාර්ලිමේන්තුවේ රැස්වීම් දින 111 වෙනුවෙන් න්‍යාය පත්‍ර 111ක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් සභාලේඛන කාර්යාංශය විසින් සකස් කරනු ලැබ රජයේ මුද්‍රණාලයේ සහාය ඇතිව මුද්‍රණය කිරීමෙන් අනතුරුව අදාළ රැස්වීම් දිනයන්හි දී පාර්ලිමේන්තුවේ එක් එක් මන්ත්‍රීවරයාගේ සභා මේසය මත තැබීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන ලද සෑම මාසයකම, අදාළ රැස්වීම් සතියේ පළමුවැනි රැස්වීම් දිනයන්හි දී පමණක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය අදාළ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට, සියලුම අමාත්‍යාංශ ලේකම්වරයන්ට හා ඊට අදාළ ව්‍යවස්ථාපිත ආයතනවලට, මාධ්‍ය ආයතනවලට සහ පාර්ලිමේන්තුවේ හා අදාළ අනෙකුත් ආයතන ප්‍රධානීන්ට හා අදාළ නිලධාරින්ට දේශීය අධිවේගී තැපැල් සේවය මඟින් බෙදාහැරීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත.

(3) එකී වර්ෂයට අදාළව පැවති පාර්ලිමේන්තු රැස්වීම් දින 111 වෙනුවෙන් පාර්ලිමේන්තුවේ කාර්ය සටහන් 111 ක් ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් සභා ලේඛන කාර්යාංශය විසින් සකස් කරනු ලැබ රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය කිරීමට කටයුතු කර ඇත.

(4) අමාත්‍යාංශ, ඒවා යටතට ගැනෙන දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළව ඒ ඒ අමාත්‍යාංශවලින් යොමු කරනු ලබන කාර්ය සාධන සහ වාර්ෂික වාර්තා 451ක්, විවිධ අණ පනත් යටතේ ඉදිරිපත් කරනු ලැබ අති විශේෂ ගැසට් පත්‍රවල පළ කරන ලද නියෝග, රෙගුලාසි සහ නියමයන් අඩංගු යෝජනා ද, යෝජනා සම්මතයන් ද ඇතුළත් අනු නීති (Subordinate Legislation) පාර්ලිමේන්තුවට පිළිගැන්වීමට කටයුතු කර ඇත.

(5) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් භාර දෙන ලද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 728 ක් ද වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න 45ක් ද ලියාපදිංචි කරන ලදුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව සංස්කරණය කර, අදාළ පරිදි අනෙකුත් භාෂාවන්ට (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) පරිවර්තනය කරවාගැනීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට හෝ අදාළ පරිදි න්‍යාය පුස්තක පරිපූරකවලට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

(6) ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න 124ක්, අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න 30ක් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අනුමත නියමයන්ට අනුකූලද යන්න පිළිබඳ සලකා බලා නිසි පරිදි අදාළ දිනට නියමිත වැඩපිළිවෙළ (Order of Business) ට ඇතුළත් කර ඇත.

(7) ජනාධිපතිවරයාගෙන් ලැබුණු සංදේශ 14 ක් ද, කථානායකවරයාගේ නිවේදන 179 ක් ද, පෞද්ගලික මන්ත්‍රී යෝජනා 71 ක් ද, දින නියමයක් නොමැති යෝජනා 05 ක් ද, වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න 35ක්, ආණ්ඩුවේ පනත් කෙටුම්පත් 34 ක් සහ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් 11 ක් ද, ඇතැම් පනත් කෙටුම්පත්වලට අදාළ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ, ගරු කථානායකතුමා විසින් කරනු ලබන ලිපිලේඛන පිළිගැන්වීම් ද ඇතුළත්ව අමාත්‍යවරයන් විසින් කරනු ලබන ලිපිලේඛන පිළිගැන්වීම යනාදිය ඇතුළත් පාර්ලිමේන්තුවේ රැස්වීම් දින 111 කට අදාළ දිනට නියමිත වැඩපිළිවෙළ (Order of Business) සකස් කිරීමේ කටයුතු සම්පාදනය කර ඇති අතර එම ලේඛන මුද්‍රණය කර අදාළ පාර්ශ්වයන්ට ලබාදීමත්, පාර්ලිමේන්තුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ කාර්යාංශයන්හි දැනගැනීම සඳහා පාර්ලිමේන්තුවේ අන්තඃජාලයට උඩුගත කිරීමට කටයුතු කරන ලදී.

(8) 2025 වර්ෂයට අදාළව අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රීවරයන් සම්බන්ධයෙන් වූ ශෝක ප්‍රකාශ යෝජනා 28 ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඊට අදාළව සකස් කරනු ලබන හැන්සාඩ් වාර්තාවේ උද්ධෘතයන් ද, පාර්ලිමේන්තු මහ ලේකම්වරයාගේ අත්සනින් යුත් ආවරණ ලිපියක් ද සහිතව සකස් කර අභාවප්‍රාප්ත මන්ත්‍රීවරයාගේ කාලත්‍රයාට හෝ සමීප ඥාතීන්ට යැවීමට කටයුතු කර ඇත.

(9) පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළව කථානායකවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන සහ තීරණ සකස් කිරීමට සහාය දක්වා ඇත.

(10) පාර්ලිමේන්තුවේ රැස්වීම් මෙහෙයවීමට පහසුවන පිණිස මූලාසනයට සහ ලේකම් මණ්ඩලයට සියලුම ලිපි ලේඛන ඇතුළත් ලිපිගොනු වෙන් වෙන් වශයෙන් සකස් කිරීම, පාර්ලිමේන්තු රැස්වීම් 111 ක් සඳහා සිදු කර ඇත.

(11) 2025 වර්ෂයේ දී පවත්වන ලද පාර්ලිමේන්තු රැස්වීම් දින 111 ක් සම්බන්ධයෙන් කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ඇතුළු මූලාසනයටත්, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, නියෝජ්‍ය මහ ලේකම්වරයා සහ සහකාර මහ ලේකම්වරයා ඇතුළු ලේකම් මණ්ඩලයටත්, පාර්ලිමේන්තුවේ රැස්වීම් ආරම්භ කිරීමට පෙර අදාළ දිනට නියමිත සභාවේ වැඩකටයුතු පිළිවෙළ සභාලේඛන කාර්යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයන් විසින් සංක්ෂිප්ත ලෙස පැහැදිලි කිරීම් සිදු කර ඇත.

(12) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව 2025 වසර තුළ අවස්ථා 27 ක දී රැස්වී ඇති අතර, එයට අමතරව පක්ෂ නායක රැස්වීම් 02 ක් ද පවත්වා ඇත. එම රැස්වීම් පැවැත්වීමට අදාළ සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට ද එම රැස්වීම් අවසානයේ කාර්ය සටහන් භාෂාත්‍රයෙන් සකස් කිරීමට ද පියවර ගන්නා ලදී.

(13) පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව 2025 වසර තුළ එක් අවස්ථාවක දී රැස් වී ඇති අතර එම රැස්වීම පැවැත්වීමට අදාළ සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට ද එම රැස්වීම අවසානයේ කාර්ය සටහන් භාෂාත්‍රයෙන් සකස් කිරීමට ද පියවර ගන්නා ලදී.

(14) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අනුමැතියට යටත්ව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 04 ක් 2025 වසර තුළ දී පවත්වා ඇති අතර, ශ්‍රී ලංකා රතු කුරුස සංවිධානය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය යන ආයතනවල ඉල්ලීම පරිදි එම ආයතනයන් විසින් පවත්වන ලද වැඩසටහන් සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සහ පහසුකම් සැපයීම සිදු කරන ලදී.

(15) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සියලුම දත්ත සහ තොරතුරු ඇතුළත් පරිගණක වැඩසටහන පවත්වාගෙන යෑම සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විවිධ ඉල්ලීම් සහ වෙනත් අවශ්‍යතා මත ඒවා නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට නොපමාව කටයුතු කර ඇත.

(16) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ නම් සිංහල අකාරාදිය අනුව සහ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව ව්‍යාවස්ථාදායක තොරතුරු පරිගණක පද්ධතිය තුළ වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යෑමට කටයුතු කිරීම සහ පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීම් සඳහා අදාළ නම් ලැයිස්තු සිංහල අකාරාදී ක්‍රමය අනුව ඉංග්‍රීසි භාෂාවෙන්, සාරාංශ සටහන් ද සමඟ අදාළ යාවත්කාලීන කිරීම් සමඟ පවත්වාගෙන යාම සිදු කර ඇත.

(17) විවිධ අණ පනත් යටතේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන අනු නීති (Subordinate Legislations) සම්බන්ධ අධිකරණ කටයුතුවල දී ඒ සම්බන්ධව පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල දී සාක්ෂි ලබාදීම සහ ඊට අදාළ තොරතුරු වාර්තා කිරීමට කටයුතු කර ඇත.

(18) ගරු කථානායකතුමා හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වග උත්තරකරුවකු කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ පවරනු ලැබූ නඩු කටයුතුවල දී ,එකී පෙත්සම් පිළිබඳ ලිඛිත නිරීක්ෂණ සකස් කිරීම, පෙරකලාසි සකස් කිරීම සහ අනෙකුත් සියලු ලිපි ලේඛන අදාළ පරිදි සූදානම් කිරීම හා නීතිපතිවරයා සමඟ අදාළ ලිපි ගනුදෙනු කිරීම සිදු කර ඇත. 2025 වර්ෂයේ දී මෙම විෂය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරූ මූලික අයිතිවාසිකම් සම්බන්ධ නඩු කටයුතු 01 ක් සහ අභියාචනාධිකරණයේ පවරනු ලැබූ රිට් පෙත්සම් 04 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත. තවද පාර්ලිමේන්තු මන්ත්‍රීවරියකගේ එම ධුරය අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනු කරන ලද අභියාචනයක් හා එහිදී ලබාදුන් තීන්දුව සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට කටයුතු කර ඇත.

(19) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 වැනි ව්‍යවස්ථාව සහ 89 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ අසුන හිස්වීමේ දී 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත 2025 වර්ෂයේදී භාෂාත්‍රයෙන් ම ලිඛිතව දැනුම්දීම සහ ඒ අනුව පාර්ලිමේන්තුවේ අසුන් හිස්වූ අවස්ථා 04 ක දී ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ අභිනවයෙන් තෝරා පත්කරනු ලැබූ මන්ත්‍රීවරුන් හතරදෙනෙකුට පාර්ලිමේන්තුවේ දී දිවුරුම් දීමට හෝ ප්‍රතිඥා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

(20) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා, අනෙකුත් කාරක සභාවන් මඟින් ඉදිරිපත් කරනු ලබන කාරක සභා වාර්තා හා ඊට අදාළ ලියකියවිලි අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුවේ පිළිගැන්වීමට කටයුතු කර ඇත.

(21) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අමාත්‍යාංශයන්ට, අනෙකුත් ආයතනයන්ට සහ මහජනතාවට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ විස්තර කඩිනමින් ලබා ගැනීමට හැකිවන පරිදි පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තක ,න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරක , පාර්ලිමේන්තුවේ රැස්වීම් වෙනුවෙන් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍ර සහ කාර්ය සටහන් ද ,පාර්ලිමේන්තුවේ ඉදිරි රැස්වීම් දිනයන් සඳහා තීරණය වී ඇති සභාවේ වැඩකටයුතු පිළිබඳ තොරතුරු ද සිංහල දෙමළ සහ ඉංග්‍රීසි ,භාෂාත්‍රයෙන් සකස් කර පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත .

(22) සියලුම නියෝග, නියමයන්, රෙගුලාසි, ගිවිසුම් සහ යෝජනා සම්මත යනාදී අනු නීති (Subordinate Legislations) පාර්ලිමේන්තුවේ දී යථා පරිදි සම්මත කරනු ලැබීමෙන් අනතුරුව ඒවා පිළිබඳව විධිමත්

ලෙස අදාළ පරිදි ජනාධිපති ලේකම් හෝ අග්‍රාමාත්‍ය සහ/හෝ අදාළ අමාත්‍යාංශ ලේකම්වරයන්ට ලිඛිතව දැනුම් දී ඇත.

(23) පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වීමේ දී සභාගත කරනු ලබන විවිධ රාජ්‍ය ආයතන මඟින් නිකුත් කරන ලද වාර්ෂික වාර්තා, වාර්ෂික කාර්ය සාධන වාර්තා සහ ගිණුම් වාර්තා මෘදු පිටපත් ආකාරයෙන් පාර්ලිමේන්තු අන්තර්ජාලයට උඩුගත කිරීමට පියවර ගන්නා ලදී.

(24) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත (Right to Information Act) යටතේ, සභාලේඛන කාර්යාංශයේ විෂය පථයට සම්බන්ධ විවිධ තොරතුරු විවිධ පාර්ශ්වයන්ට ලිඛිතව සැපයීමට අවස්ථාවෝචිතව කටයුතු සම්පාදනය කර ඇත. ඒ අනුව, 2025 වර්ෂයේදී තොරතුරු සැපයීම් 43ක් සිදු කර ඇත.

(25) විවිධ අවස්ථාවල දී පොලිස් විමර්ශනවලට අදාළව හා අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසය, ශ්‍රී ලංකා පොලිසියේ නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය විසින් ඉල්ලා සිටින ලද තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

(26) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම පරිදි ඔවුන්ගේ පාර්ලිමේන්තු සේවා කාලය තහවුරු කරමින් විවිධ ආයතනවලට හෝ අදාළ අයගේ දැනගැනීම පිණිස හෝ සේවා සහතික නිකුත් කිරීම 2025 වසරේ දී අවස්ථා 50 ක දී සිදු කරන ලදී.

(27) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, අමාත්‍යාංශ පිළිබඳ තොරතුරු හා නෛතික කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු වැනි විවිධ තොරතුරු මහජනතාවගේ ඉල්ලීම පරිදි වරින් වර ඔවුන් වෙත නිකුත් කිරීම ද සිදු කරන ලදී. ව්‍යවස්ථාදායක කටයුතු සම්බන්ධයෙන් නිවැරදි හා ඉක්මන් තොරතුරු සමාජගත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමට පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවට සහාය දැක්වීමද සිදු කරන ලදී.

(28) විවිධ අවස්ථාවල ව්‍යවස්ථාදායක කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සහ අනුබද්ධිත කාර්ය මණ්ඩලවල සාමාජික මහත්ම මහත්මීන් අවශ්‍ය පරිදි දැනුම්වත් කිරීම සඳහා ක්‍රියාකාරීව මැදිහත්වන ලදී.

(29) පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන සෑම වේලාවකදී ම සභා ලේඛන කාර්යාලයේ නිලධාරියෙකු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සඳහා වෙන් කර ඇති මැදිරියෙහි රාජකාරි කටයුතු කරමින් සභාවේ වැඩ කටයුතු සම්බන්ධයෙන් වාර්තා කිරීම සිදු කර ඇත.

(30) ඉහතින් සඳහන් කරන ලද කරුණුවලට සෘජුවම ඇතුළත් නොවුණ ද සභාවේ කටයුතු සම්බන්ධ සහ ඊට ආනුෂංගික කටයුතුවලට අදාළව මහ ලේකම්වරයා විසින් ලබා දෙනු ලබන උපදෙස්/මග පෙන්වීම්වලට අනුගතව අවශ්‍ය කටයුතු අවස්ථානුකූලව සිදුකොට සභාවේ කටයුතු බාධාවකින් තොරව හා ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට මෙම කාර්යාංශය විසින් උපරිම දායකත්වයක් ලබා දී ඇති බවත් මෙහිලා විශේෂයෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි.

<u>පනත් කෙටුම්පත් කාර්යාංශය</u>

පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති ප්‍රමුඛතම ව්‍යවස්ථාදායක කාර්යභාරය වන නීති සම්පාදනයට අදාළ ක්‍රියාපටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුව ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම පනත් කෙටුම්පත් කාර්යාංශයේ මෙහෙවරයි.

ඒ යටතේ පනත් කෙටුම්පත් කාර්යාංශය විසින් රජයේ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ සිට සම්මත කිරීමෙන් පසුව එම පනත් සඳහා කථානායකවරයාගේ සහතිකය සටහන් කිරීමෙන් අනතුරුව මුද්‍රණය කිරීම දක්වා සපුරාලිය යුතු වන සියලුම ව්‍යවස්ථාදායකමය පියවරයන්ට අදාළ කටයුතු භාෂාත්‍රයෙන්ම ඉටු කරනු ලබන්නේය.

එසේම, නව ස්ථාවර නියෝග 52(3) ප්‍රකාරව පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් නීතිපතිවරයා වෙත යොමුකර ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව මතය විමසීමෙන් අනතුරුව ගැසට් මුද්‍රණයේ සිට එම පනත් පාර්ලිමේන්තුවේ දී සම්මත කර මුද්‍රණය කරන තෙක් කටයුතු ද ඒ අයුරින්ම භාෂාත්‍රයෙන්ම ඉටු කරනු ලබයි.

**ඒ අනුව, 2025 වර්ෂය තුළ දී,**

| | | |
|---|---|---|
| 1. | පනත් කෙටුම්පත් කාර්යාංශය වෙත ලැබුණු රජයේ පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව | 38 |
| 2. | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව | 34 |
| 3. | පනත් කෙටුම්පත් කාර්යාංශය විසින් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලද රජයේ පනත් කෙටුම්පත් සංඛ්‍යාව | 34 |
| 4. | ඉල්ලා අස්කර ගනු ලැබූ රජයේ පනත් කෙටුම්පත් සංඛ්‍යාව | 00 |
| 5. | පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ රජයේ පනත් කෙටුම්පත් සංඛ්‍යාව | 26 |
| 6. | ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කළ රජයේ පනත් සංඛ්‍යාව | 26 |
| 7. | මුද්‍රණය කිරීමට කටයුතු කරන ලද පනත් සංඛ්‍යාව | 26 |

ඉහත වර්ෂය තුළ දී ම,

| | | |
|---|---|---|
| 1. | පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමට අදාළව පනත් කෙටුම්පත් කාර්යාංශය වෙත ලැබුනු ඉල්ලීම් සංඛ්‍යාව | 45 |
| 2. | ස්ථාවර නියෝග 52(3) ප්‍රකාරව නීතිපතිවරයා වෙත යොමු කළ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සංඛ්‍යාව | 39 |
| 3. | මුද්‍රණය කිරීම පිණිස පනත් කෙටුම්පත් කාර්යාංශය විසින් රජයේ මුද්‍රණාලය වෙත යොමු කරන ලදුව මුද්‍රණය කරන ලද පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව | 13 |
| 4. | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රි පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව | 12 |
| 5. | අමාත්‍ය වාර්තා ලබා ගැනීම පිණිස අමාත්‍යාංශ වෙත යවන ලද පෞද්ගලික මන්ත්‍රි පනත් කෙටුම්පත් සංඛ්‍යාව | 11 |
| 6. | ඉල්ලා අස්කර ගනු ලැබූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සංඛ්‍යාව | 01 |
| 7. | පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සංඛ්‍යාව | |
| 8. | ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කළ පෞද්ගලික මන්ත්‍රී පනත් සංඛ්‍යාව | |
| 9. | ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා වාර ගණන | 00 |

මෙයට අමතරව, පහත සඳහන් කාර්යයන්ද පනත් කෙටුම්පත් කාර්යාංශය මඟින් 2025 වර්ෂය තුළදී සිදු කරන ලදී.

(අ) රජයේ පනත් කෙටුම්පත් හා සම්බන්ධව පවත්වන ලද ආංශික අධීක්ෂණ කාරක සභා සහ රජයේ මුදල් පිළිබඳ කාරක සභා රැස්වීම් සඳහා පනත් කෙටුම්පත් කාර්යාංශයේ නිලධාරීන් සහභාගී වී අවශ්‍ය දායකත්වය ලබා දීම;

(ආ) පනත්, පනත් කෙටුම්පත් හා පනත් කෙටුම්පත් කාර්යාංශය පිළිබඳ තොරතුරු පාර්ලිමේන්තු වෙබ් අඩවිය හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ මහජනතාවට භාෂාත්‍රයෙන්ම ලබා ගැනීමට හැකිවනු පිණිස අවශ්‍ය පහසුකම් සැලසීම;

(ඇ) පනත් කෙටුම්පත්වලට අදාළව ව්‍යවස්ථාදායක සේවා තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම;

(ඈ) 2024 වර්ෂයේ සම්මත වූ සියලුම පනත් ගොනුකොට පොතක් වශයෙන් බැඳීමට අවශ්‍ය කටයුතු සැලසීම;

(ඉ) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ බාහිර පාර්ශ්වයන් විසින් පනත් කෙටුම්පත් කාර්යාංශයට අදාළව ඉල්ලා ඇති තොරතුරු පාර්ලිමේන්තුවේ තොරතුරු නිලධාරී වෙත ලබා දීමට කටයුතු කිරීම;

(ඊ) ගරු අමාත්‍යවරුන්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ වෙනත් විවිධ ආයතන වෙතින් ලද ඉල්ලීම් මත පනත් කෙටුම්පත්/පනත් පිළිබඳව සහ ඒවා සම්මත කිරීමේ ක්‍රියාදාමයන්ට අදාළව තොරතුරු ලබාදීම;

(උ) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීන්දු/ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද පෙත්සම් හා පනත් කෙටුම්පත්වලට කථානායක සහතිකය සටහන් කිරීමට අදාළව ගරු කථානායකතුමා විසින් පාර්ලිමේන්තුවේදී කරනු ලබන නිවේදන සකස් කිරීම

(ළ) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීන්දු එක් රැස් කර, සකස් කර පොතක් ලෙසින් මුද්‍රණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම

(ඍ) ගරු කථානායකතුමාගේ සහතිකය ලබා ගැනීම සඳහා මුද්‍රණය කරන ලද අනුඥ පිටපත නිසි පරිදි සකස්කර ඉදිරිපත් කිරීම

පනත් කෙටුම්පත් කාර්යාංශය මගින් සිදු කරන ලදී.

<u>අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කාර්යාංශය</u>

| අපේක්ෂිත ප්‍රතිඵලය | අත්පත්කරගත් ප්‍රතිඵලය |
|---|---|
| අමාත්‍යාංශ ලේකම්වරුන් සමඟ ඵලදායී සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම | පවත්වන ලද කාරක සභා රැස්වීම් ගණන 60 කි. ***(ඇමුණුම 1)***<br><br>පවත්වන ලද අනු කාරක සභා රැස්වීම් ගණන 37 කි. ***(ඇමුණුම 1)*** |
| අවශ්‍ය ලිපිලේඛන නිවැරදි ආකාරයට ලබා දීම | කාරක සභා රැස්වීම් සඳහා අවශ්‍ය න්‍යාය පත්‍රය සහ අනෙකුත් ලිපි ලේඛන, කාරක සභා රැස්වීම්වල කාර්යය සටහන් යනාදිය නිවැරදිව පිළියෙල කිරීම ඇතුළත්ව ඵලදායී සහ කාර්යක්ෂම ලෙස කාරක සභා රැස්වීම් 60 ක් පැවැත්විණි. ***(ඇමුණුම 1)***<br><br>අනු කාරක සභා රැස්වීම් සඳහා අවශ්‍ය න්‍යාය පත්‍රය සහ අනෙකුත් ලිපි ලේඛන, අනු කාරක සභා රැස්වීම්වල කාර්යය සටහන් යනාදිය නිවැරදිව පිළියෙල කිරීම ඇතුළත්ව ඵලදායී සහ කාර්යක්ෂම ලෙස අනු කාරක සභා රැස්වීම් 37 ක් පැවැත්විණි. ***(ඇමුණුම 2)***<br><br>කාරක සභා මගින් ලබාදෙන නිර්දේශ අනුව විශේෂ වැඩමුළු 03 ක් පැවැත්විණි. ***(ඇමුණුම 4)*** |
| යෝජනා සඳහා වන පිළිතුරු වාර්තා හැකි ඉක්මනින් අමාත්‍යාංශවලින් ලබා ගැනීම | වාර්තා කැඳවමින් අමාත්‍යාංශ වෙත යොමු කරන ලද යෝජනා සංඛ්‍යාව - **385**<br>අමාත්‍යාංශ වෙතින් ලද වාර්තා සංඛ්‍යාව - **263**<br>***(ඇමුණුම 3)*** |
| වරින් වර පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කිරීම | 2025 වර්ෂයේදී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සඳහා යොමු කිරීමෙන් අනතුරුව සලකා බලන ලද පනත් කෙටුම්පත්, නියෝග, නියම, නීති සහ නිවේදන සංඛ්‍යාව - **13** ***(ඇමුණුම 5)***<br><br>2025 වර්ෂයේදී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සඳහා යොමු කිරීමෙන් අනතුරුව සලකා බලන ලද වාර්ෂික වාර්තා හා වාර්ෂික කාර්ය සාධන වාර්තා සංඛ්‍යාව - **66** ***(ඇමුණුම 6)***<br><br>ඉහත සඳහන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සඳහා යොමු කරන ලද පනත් කෙටුම්පත්, නියෝග, නියම, නීති, නිවේදන, වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සම්බන්ධයෙන් සියලුම වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.<br><br>දසවැනි පාර්ලිමේන්තුවේ 2025 වර්ෂයේදී පැවැත්වූ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා අතරින් කාර්යය සටහන් සහ සම්මත කරන ලද අනුපිළිවෙල අනුව සකස් කරන ලද අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ පළමුවැනි වාර්තාව 2026.01.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. |

**2025 වර්ෂයේදී පැවැත්වූ කාරක සභා** *(ඇමුණුම 1)*

| අනු අංකය | පැවති කාරක සභාව | පැවති දිනය | පැවැති කාරක සභා සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/20<br>• 2025/06/17 | 2 |
| 2 | මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/03/19 | 1 |
| 3 | ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/20 | 1 |
| 4 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/03/07<br>• 2025/06/03<br>• 2025/08/06<br>• 2025/09/25<br>• 2025/11/19 | 5 |
| 5 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/28<br>• 2025/10/23 | 2 |
| 6 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/03/12<br>• 2025/06/18 | 2 |
| 7 | ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/07<br>• 2025/09/09 | 2 |
| 8 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/03/04<br>• 2025/06/19<br>• 2025/11/25 | 3 |
| 9 | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/01/24<br>• 2025/02/28<br>• 2025/07/22<br>• 2025/08/19<br>• 2025/10/09 | 5 |
| 10 | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/03/05<br>• 2025/09/12 | 2 |
| 11 | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/03/04<br>• 2025/10/10 | 2 |
| 12 | වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/05<br>• 2025/06/04<br>• 2025/07/22 | 3 |
| 13 | කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/21<br>• 2025/10/08 | 2 |
| 14 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/27<br>• 2025/08/19 | 2 |
| 15 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/05<br>• 2025/02/14<br>• 2025/07/24 | 4 |

| | | | |
|---|---|---|---|
| | | • 2025/11/13 | |
| 16 | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/03/03<br>• 2025/06/05<br>• 2025/09/24 | 3 |
| 17 | විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/18<br>• 2025/08/21 | 2 |
| 18 | මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/22<br>• 2025/07/25 | 2 |
| 19 | බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/03/06<br>• 2025/11/18 | 2 |
| 20 | තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/19<br>• 2025/06/13<br>• 2025/08/07 | 3 |
| 21 | කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/21<br>• 2025/04/08<br>• 2025/07/09 | 3 |
| 22 | පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/03/05 | 1 |
| 23 | බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/03/08 | 1 |
| 24 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | • 2025/02/27<br>• 2025/04/07<br>• 2025/06/03<br>• 2025/06/17<br>• 2025/07/24 | 5 |
| **පැවති මුළු කාරක සභා රැස්වීම් සංඛ්‍යාව** | | | **60** |

***2024 සැප්තැම්බර් මස 24 වැනි දින නවවැනි පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද අතර දසවැනි පාර්ලිමේන්තුව 2024 නොවැම්බර් මස 21 වැනි දින ආරම්භ විය.**

*** 2025 ජනවාරි මස 09 වැනි දින අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සඳහා සාමාජික මන්ත්‍රීවරුන් නම් කරන ලදී.**

***2025 නොවැම්බර් මස 19 වැනි දින ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සහ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙනුවට,**

**1. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

**2. වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සහ**

**3. නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

**පත් කරන ලදී.**

*(ඇමුණුම 2)*

**2025 වර්ෂයේදී පැවැත්වූ අනු කාරක සභා**

| අනු අංකය | කාරක සභාව | අනු කාරක සභාව | පැවති දිනය | පැවැති අනු කාරක සභා සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | අනු කාරක සභාව 01 - අවිධිමත් ප්‍රවාහන කර්මාන්තය හා සම්බන්ධ වෘත්තිකයින්ගේ වෘත්තිය සුරක්ෂිතතාව තහවුරු කිරීම | • 2025/02/25<br>• 2025/03/18<br>• 2025/03/18 | 3 |
| 2 | | අනු කාරක සභාව 02 - ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ නීතිමය රාමුව ශක්තිමත් කිරීම තුළින් සාධනීය දිශානතියක් කරා ප්‍රවාහන ක්ෂේත්‍රය යොමු කරවීම | • 2025/02/22<br>• 2025/04/09<br>• 2025/04/10<br>• 2025/05/22<br>• 2025/09/26 | 5 |
| 3 | | අනු කාරක සභාව 03 - ප්‍රවාහන කර්මාන්තය හා බැඳි අතිරේක සේවා නිර්මාණය කිරීම සඳහා ව්‍යාපෘති මාදිලි (Business Models) සැකසීම | • 2025/03/01<br>• 2025/03/19<br>• 2025/04/09<br>• 2025/06/05 | 4 |
| 4 | | අනු කාරක සභාව 04 - දුම්රිය දෙපාර්තමේන්තුව කාර්යක්ෂම සහ සතුටුදායක සේවා උත්පාදනය කරන ස්ථානයක් බවට පත් කිරීම | • 2025/10/07 | 1 |
| 5 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ අනු කාරක සභාව | • 2025/08/05<br>• 2025/09/23<br>• 2025/10/22 | 3 |
| 6 | | පාසල්වල පවතින මානව සම්පත් ඌනතාවය පිළිබඳ අනු කාරක සභාව | • 2025/07/23<br>• 2025/09/09 | 2 |
| 7 | | අතරමැදි ශ්‍රේණි සඳහා පාසල්වලට ළමුන් ඇතුළත් කිරීම පිළිබඳ අනු කාරක සභාව | • 2025/07/11<br>• 2025/07/22<br>• 2025/07/24 | 3 |
| 8 | | අධ්‍යාපන සභාව පිහිටුවීම පිළිබඳ අනු කාරක සභාව | • 2025/07/08<br>• 2025/07/25<br>• 2025/10/10 | 3 |
| 9 | | උසස් අධ්‍යාපන අංශය පිළිබඳ අනු කාරක සභාව | • 2025/07/11<br>• 2025/09/12<br>• 2025/09/23<br>• 2025/11/11 | 4 |
| 10 | | වෘත්තීය අධ්‍යාපන අංශය පිළිබඳ අනු කාරක සභාව | • 2025/07/25 | 1 |
| 11 | | පාසල්වල පවතින භෞතික සම්පත් ඌනතාවය පිළිබඳ අනු කාරක සභාව | • 2025/11/10 | 1 |
| 12 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | අනු කාරක සභාව 01 - තෘප්තිමත් රාජ්‍ය සේවකයකු නිර්මාණයෙන් ගුණාත්මක රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම | - | - |
| 13 | | අනු කාරක සභාව 02 - සමස්ත රාජ්‍ය සේවය සමාලෝචනය කරමින් රාජ්‍ය | • 2025/08/07<br>• 2025/08/21 | 4 |

| | | | | |
|---|---|---|---|---|
| | | සේවය සඳහා විධිමත් වැටුප් ව්‍යුහයක් සකසා ගැනීම හා වෘත්තීයභාවය ඉහළ නැංවීම | • 2025/09/11<br>• 2025/11/10 | |
| 14 | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | අනුකාරක සභාව 01 - ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැටළුව විසඳීමට ගත හැකි ඉදිරි පියවර | • 2025/08/22<br>• 2025/10/10<br>• 2025/11/11 | 3 |
| එකතුව | | | | **37** |

*(ඇමුණුම 3)*

**<u>2025 වර්ෂයේ කාරක සභාවේදී සලකා බලන ලද යෝජනා</u>**

| අනු අංකය | පැවති කාරක සභාව | අමාත්‍යාංශය වෙත යොමු කරන ලද යෝජනා සංඛ්‍යාව | ලද වාර්තා සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 22 | 17 |
| 2 | මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 10 | 10 |
| 3 | ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 04 | 03 |
| 4 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 63 | 39 |
| 5 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 44 | 38 |
| 6 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 10 | 06 |
| 7 | ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 12 | 01 |
| 8 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 04 | 02 |
| 9 | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 32 | 32 |
| 10 | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 01 | - |
| 11 | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 39 | 12 |
| 12 | වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 03 | 03 |
| 13 | කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 01 | 01 |
| 14 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 17 | 17 |
| 15 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 53 | 39 |
| 16 | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 04 | 02 |
| 17 | විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | - | - |
| 18 | මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 13 | 13 |
| 19 | බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 05 | 04 |
| 20 | තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 07 | 01 |

| | | | |
|---|---|---|---|
| 21 | කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | - | - |
| 22 | පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 09 | 04 |
| 23 | බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 10 | 10 |
| 24 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 09 | 06 |
| 25. | නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 02 | - |
| 26. | ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 11 | 03 |
| 27. | වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | - | - |
| | **එකතුව** | **385** | **263** |

***(ඇමුණුම 4)***

**<u>2025 වර්ෂයේදී පැවැත්වූ විශේෂ වැඩමුළු</u>**

| අනු අංකය | පැවති විශේෂ වැඩමුළුව | පැවති දිනය |
|---|---|---|
| 1 | අස්වැසුම වැඩසටහන සම්බන්ධයෙන් ලෝක බැංකු නියෝජිතයින් විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ සිදුකළ විශේෂ සාකච්ඡාව | 2025/10/22 |
| 2 | රජයේ ඩිජිටල් ආර්ථික උපායමාර්ගය පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා විශේෂ වැඩමුළුව | 2025/03/10 |
| 3 | සමුපකාර ගැටලු සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරුන්, පළාත් සමුපකාර අමාත්‍යාංශ ලේකම්වරුන් සහ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර්වරුන් සමග පැවති විශේෂ සාකච්ඡාව | 2025/11/19 |
| 4 | චීන දූත පිරිස සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභික මන්ත්‍රීවරුන් සමඟ පැවති විශේෂ සාකච්ඡාව | 2025/10/24 |

***(ඇමුණුම 5)***

**<u>2025 වර්ෂයේදී පනත් කෙටුම්පත්, නියෝග, නියම, නීති සහ නිවේදන සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තා</u>**

| අනු අංකය | කාරක සභාව | ගැසට් අංකය | පනත් කෙටුම්පත්, නියෝග, නියම, නීති සහ නිවේදන | කාරක සභාව පැවති දිනය | පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කළ දිනය |
|---|---|---|---|---|---|
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිලියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනන යාම. | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.1 | මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුළ දැනුවත්කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය වෙනුවට වඩා වැඩිදියුණු කරන ලද පැකේජයක් භාවිතා කිරීම |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වැර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව , සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කලමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් | ප්‍රායෝගික දුෂ්කරතා මග හරවා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරීයෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල නොවේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණයකිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | . |

| | | | | |
|---|---|---|---|---|
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අදාල නැත | | අක්‍රිය ගිණුම් නොමැත |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂය මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරිම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.1 | අදාල රෙගුලාසිවලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | | අවස්ථානුකූලව වාර්තා ඉදිරිපත් කර ඇත. | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳව එහි තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනිමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හො වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | 8 වන වගන්තිය අදාල නොවේ. | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | අභ්‍යන්තර කටයුතු ඒකකය යටතේ ක්‍රියාත්මක වේ. |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අදාල නැත | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අදාල නොවේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවරදි කොට තිබීම | අනුකූල වේ | | |

ඇමුණුම 01


ORGANIZATIONAL CHART
PARLIAMENT OF SRI LANKA
SECRETARY GENERAL OF PARLIAMENT
CHIEF OF STAFF AND
DEPUTY SECRETARY GENERAL OF PARLIAMENT
ASSISTANT SECRETARY GENERAL OF PARLIAMENT
(ADMINISTRATIVE SERVICES)
ASSISTANT SECRETARY GENERAL OF PARLIAMENT
LEGISLATIVE SERVICES
N
L
K
J
IA
I
H
G
F
E
D
C
B
A
Serjeant-At-Arms
Director (Administration)
Director (Finance)
Coordinating Engineer
Director (Catering & House Keeping)
Director Information Systems & Management
Director Legislative Services
Editor of Hansard
Director Communication
Chief Internal Auditor
Deputy Serjeant-At-Arms
Deputy Director Administration
Deputy Coordinating Engineer
Systems Engineer
Chief Parliamentary Interpreter
Librarian
Deputy Editor of Hansard
Assistant Serjeant-At-Arms
Asst Director (Admin) Catering Accounts
Asst Director (Admin) Finance & Acct Supplies & Services
Executive House Keeper
Executive Chef F&B Manager
Systems Analyst/ Communication & Security Engineer
Deputy Chief Parliamentary Interpreter
Assistant Editor of Hansard
Media Manager
Public Outreach Manager
Principal Officer
Assistant House Keeper
Sous Chef Dy F&B Manager
Deputy Librarian Chief Research Officer
Deputy Principal Officer
Chief Inspector Civil/ Electrical
Restaurant Manager
Parliamentary Interpreter
Hansard Reporter
Transport Officer
Bangalow Manager
Computer Programmer/ Web Editor
Committee Reporter
Assistant Principal Officer
Inspector Civil/ Electrical
House Keeping Supervisor Garden Supervisor
Assistant Research Officer
Indexing Officer
Parliamentary Officer
Technical Officer (Civil/ Electrical)
Leading Cook
Telephone Supervisor
Cook
Documentation Assistant
Cashier Clerk
Leading F&B Assistant
Computer Operator Computer Technician
Junior Asst Librarian
Recording Supervisor
Media Office Coordinator
Handyman
Technical Asst.
Library Assistant
Recording Assistant
Assistant Cook
Skilled Labourer Technical
Skilled Labourer Civil/ Electrical
Stores Assistant/ Stores Services Assistant
Utility Receiving Assistant
Library Attendant
viii

ඇමුණුම 02

ඒසීඒ-එෆ්

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | තථ්‍ය 2025 රු. | 2024 රු. | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 3,679,007,000 | 3,515,427,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 41,157,636 | 38,904,960 | ඒසීඒ-4 |
| 28,000,000 | අත්තිකාරම් ගිණුම් | | 32,799,311 | 33,407,302 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **3,752,963,947** | **3,587,739,262** | |
| | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **3,752,963,947** | **3,587,739,262** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **433** | 82,664,298 | |
| - | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **3,752,963,514** | **3,505,074,964** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 1,587,030,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,491,852,940 | 1,274,022,050 | ඒසීඒ-2(ii) |
| 2,090,756,606 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 1,753,200,512 | 1,772,859,522 | |
| 494,828,040 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 459,211,526 | 412,739,263 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **4,172,614,646** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **3,704,264,978** | **3,459,620,835** | |
| | **මූලධන වියදම්** | | | | |
| 738,600,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 79,438,065 | 61,728,156 | ඒසීඒ-2(ii) |
| 234,215,354 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 86,156,671 | 55,153,626 | |
| 3,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 2,000,000 | හැකියා වර්ධනය | 14 | 1,941,750 | 964,237 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| **977,815,354** | **මුළු මූලධන වියදම් (උ)** | | **167,536,486** | **117,846,019** | |
| | තැන්පතු ගෙවීම් | | 50,438,933 | 25,330,686 | ඒසීඒ-4 |
| 30,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 31,607,619 | 30,746,602 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **82,046,552** | **56,077,288** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 3,953,848,016 | 3,633,544,142 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (200,884,502) | (128,469,178) | |
| | | | (200,884,502) | (128,469,178) | ඒසීඒ-7 |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | - | - | ඒසීඒ-3 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | |

ඇමුණුම 03

ඒසීඒ-8

**2025 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | සත්‍ය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 22,088,728,303 | 22,002,571,633 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5/5(ඒ) | 84,780,600 | 85,972,292 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **22,173,508,903** | **22,088,543,925** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 77,295,627 | 69,206,022 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 22,088,728,303 | 22,002,571,633 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම | ඒසීඒ-4 | 7,484,973 | 16,766,270 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **22,173,508,903** | **22,088,543,925** |

පිටු අංක7 සිට 39 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 40 සිට 71 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | දිනය : 2026.02.27 |
| දිනය : | දිනය : | |

කුෂානි රෝහණදීර
පාර්ලිමේන්තුවේ මහ ලේකම්
පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ

කුෂානි රෝහණදීර
පාර්ලිමේන්තුවේ මහ ලේකම්
පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ

ජී. සරත් කුමාර
අධ්‍යක්ෂ මුදල්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

ඇමුණුම 04

ඒසිඒ-සි

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | තතත 2025 රු. | 2024 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 185,552,192 | 127,612,825 |
| අග්‍රිම ලැබීම් | 3,679,007,000 | 3,515,427,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 34,445,127 | 33,261,466 |
| තැන්පතු ලැබීම් | 41,157,636 | 38,904,960 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **3,940,161,955** | **3,715,206,251** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 3,230,908,308 | 3,044,407,521 |
| සහනාධාර සහ මාරුකිරීම් | 459,211,526 | 412,739,263 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 458,650 | 1,622,561 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 433 | 82,664,298 |
| අත්තිකාරම් ගෙවීම් | 31,607,619 | 30,595,902 |
| තැන්පතු ගෙවීම් | 50,438,933 | 25,330,687 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **3,772,625,469** | **3,597,360,232** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **167,536,486** | **117,846,019** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වත්කම් ඉදිකිරීම, මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම | 167,536,486 | 117,846,019 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **167,536,486** | **117,846,019** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(167,536,486)** | **(117,846,019)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම | - | - |
| විදේශීය ණය ගැනීම | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

ඇමුණුම 05

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/A/PAR/02/25/10 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 29 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
පාර්ලිමේන්තුව

**ශීර්ෂය 016 - පාර්ලිමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශීර්ෂය 16 - පාර්ලිමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.3 | පාර්ලිමේන්තුව සතු ජයන්තිපුර පිහිටි ගොඩනැගිලිවල වටිනාකම ගිණුම්ගත කර නොතිබීම. | 3.3 (ආ) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව, සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කර තිබෙන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විශේෂයෙන් වගබලා ගතයුතු වුවත්, පහත දැක්වෙන කරුණු හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කර නොතිබුණි.

(අ) වැය විෂයයන් 09 ක වාර්ෂික අයවැය ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම නිසා මුදල් රෙගුලාසි 66 මඟින් රු.617,000 සිට රු.99,000,000 දක්වා එනම් සියයට 06 සිට සියයට 466 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වැඩිකරගෙන වියදම් දරා තිබුණි

(ආ) වැය විෂයයන් 07 ක වාර්ෂික අයවැය ප්‍රතිපාදනය මඟින් අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා මුදල් රෙගුලාසි 66 මඟින් රු.3,890,000 සිට රු.96,732,354 දක්වා එනම් සියයට 07 සිට සියයට 83 දක්වා පරාසයකින් ප්‍රතිපාදන අඩු කරගෙන වියදම් දරා තිබුණි.

(ඇ) වැය විෂයයන් 03 ක් සඳහා මු.රෙ 66 යටතේ මාරු කරගෙන තිබුණු එකතුව රු.17,200,000 කින් රු.1,560,621 ක් හෙවත් සියයට 06 ක සිට සියයට 30 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 11,500,000 ක් මුළු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණු අතර තවත් වැය විෂයයන් 41 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.1,178,238,040 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.346,607,120 ක් හෙවත් සියයට 18 සිට සියයට 96 දක්වා සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ඉ) ප්‍රාග්ධන වැය විෂයයන් 05ක් සඳහා සලසා තිබුණු රු.11,850,000 ක් මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණු අතර තවත් ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.922,350,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.797,310,649 ක් හෙවත් සියයට 33 සිට සියයට 99 දක්වා සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

**3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 සහ 3 ඡේද අනුව සමාලෝචිත වර්ෂයට අදාල සියළු බැඳීම් හඳුනාගෙන එය බැරකමක් ලෙස සටහන් කළ යුතු වුවත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය (SA92) අනුව බැඳීම් හා බැරකම් වල එකතුව රු.9,742,546 ක් වූ අතර පාර්ලිමේන්තුවේ බැරකම් ලේඛනය අනුව එකතුව රු.51,215,139 ක් වීමෙන් රු.41,472,593 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2025 දෙසැම්බර් 31 දිනට වූ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ (SA92- භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයේ) හෝ ආයතනයේ බැරකම් ලේඛනයේ ඇතුළත් වී නොතිබුණු සමාලෝචිත වර්ෂයට අදාලව එකතුව රු.11,719,005 ක් වූ බැරකම් 2026 ජනවාරි හා පෙබරවාරි මාසවල නිරවුල් කර තිබුණි.

**3.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 137 | වවුචරයක් ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමේ දී අනුමත කරන බලධාරියා විසින් වවුචරය අනුමත කර තිබිය යුතු වුවත් අවස්ථා 04 කදී රු.310,700 ක් වූ ගෙවීම් වවුචර් අනුමත කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 139(4), 139(5), 260 හා 264 | නියමිත තැනැත්තාටම මුදල් ගෙවීමට අනන්‍යතාවය හඳුනාගෙන සෑම ගෙවීමක් ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයා විසින් වවුචරයෙහි අත්සන් තැබීම හෝ කුවිතාන්සියක් ලබාගෙන තිබිය යුතු වුවත් නියැදි පරීක්ෂාව අනුව අවස්ථා 04 කදී එකතුව රු.3,721,938 ක් වූ වවුචර්වලට අදාලව ආදායකයා මුදල් ලබාගත් බවට අත්සන තබා නොතිබුණි |
| (iii) | මුදල් රෙගුලාසි 755(1) සහ (2) | තත්‍ය වශයෙන්ම පවත්නා තොගය අදාල බඩු වට්ටෝරු පොතේ (Inventory book) යාවත්කාලීන කළ යුතු වුවද එසේ කටයුතු කර නොමැති වීමෙන් සමීක්ෂණ මණ්ඩලය විසින් බඩු වට්ටෝරු පොතේ දැක්වෙන ශේෂය සමඟ සෑම භාණ්ඩයක්ම නිවැරදිදැයි පරීක්ෂා කිරීම සිදු කර නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදය | වටිනාකම රු.7,820,000 ක් වූ ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් තුල ඇතුළත් කර නොතිබුණි. |
| (ඇ) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය | සියළුම රජයේ සංචිත වාහනවල රාජ්‍ය ලාංඡන යෙදිය යුතු වුවත් පාර්ලිමේන්තුව සතු සංචිත වාහන 50 ක රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කල යුතු වුවද වාහන 41 ක ඉන්ධන දහන පරීක්ෂාව චක්‍රලේඛ ප්‍රකාරව සිදු කර නොතිබුණි |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඉ) 2023 මැයි 02 දිනැති අංක MOT/2023/01 දරන තාක්ෂණ අමාත්‍යංශ ලේකම්ගේ චක්‍රලේඛය මගින් දක්වා ඇති තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය

| | |
|---|---|
| (i) 4.1.2 (ඇ) හා 4.3.18 ඡේද | ආයතනයේ තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය සම්බන්ධ වගකීම අභ්‍යන්තර විගණක වෙත පැවරෙන නමුත් එසේ වගකීම පවරා නොතිබුණි. ඒ නිසා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අදාලව අභ්‍යන්තර විගණන වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ii) 4.1.3 ඡේදය | අදාළ ක්‍රියාකාරකම් සඳහා උපායමාර්ගික උපදෙස් සැපයීම සඳහා තොරතුරු ආරක්ෂණ පිහිටුවා නොතිබුණි |
| (iii) 4.1.4 ඡේදය | ආයතන ප්‍රධානී වෙත ඍජුවම වාර්තා කරන, තොරතුරු හා තොරතුරු තාක්ෂණ වත්කම් සම්බන්ධයෙන් ආයතනයේ අවදානම් කලමණාකරණය අධීක්ෂණය කිරීමේ වගකීම දැරිය යුතු අවදානම් කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. |
| (iv) 4.2.5 ඡේදය | ආයතනයේ තොරතුරු වත්කම් හා සම්බන්ධ අවදානම් හා එමගින් වන බලපෑම් තිරණය කිරීම සඳහා විධිමත් තක්සේරුවක් කළයුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

### 3.4 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) පරිදි තත්ත්කාර්ය අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යයන් අවසන් කර දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද, එකතුව රු.186,000 ක් වූ තත්ත්කාර්ය අතුරු අග්‍රිම 07 ක් පියවීම සඳහා දින 03 ත්, දින 22 ත් අතර කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) චක්‍රලේඛයේ (අ) ඡේදය හා මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමට ප්‍රථම අදාළ කාර්යය පිළිබඳ ගණන් හිලව් හෙවත් දළ ඇස්තමේන්තුවක් පිළියෙල කර එය විධිමත් පරිදි අනුමත කළ පසු අතුරු අග්‍රිමයක් නිකුත් කළ යුතු වුවද, එසේ නොකිරීම නිසා අවස්ථා 15 කදී, ඉල්ලුම් කල මුදලින් ප්‍රතිශතයක් ලෙස සියයට 25 සිට සියයට 95 දක්වා අතුරු අග්‍රිමය ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

6

### 3.5 තැන්පතු

2025 දෙසැම්බර් 31 දිනට ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් රු.3,330,808 ක් වූ අතර මේ තුළ වර්ෂ 02 ඉක්ම වූ රු.244,282 ක තැන්පතු ශේෂ 06 ක් සම්බන්ධයෙන් මු.රෙ 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 4.2 ප්‍රසම්පාදනයන්

(අ) විගණනයට ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.3 ඡේදය අනුව සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන අත්පොතේ 04 වන පරිච්ඡේදයේ ඇමුණුම III හි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව පිළියෙල කළයුතු අතර ප්‍රසම්පාදන අත්පොතේ 4.1(ඇ) අනුව ප්‍රසම්පාදන සැලසුම් නිරතුරුව අධීක්ෂණය කිරීම අවම වශයෙන් කාර්තුමය පදනමින්වත් යාවත්කාලීන කර සංශෝධිත සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත අනුමැතියට ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රධාන වශයෙන් සැපයුම් හා සේවා අංශය හා ඉංජිනේරු අංශය මඟින් ඉටු කරන අතර නිල ඇඳුම්,සපත්තු, පිරිසිදු කිරීමේ ද්‍රව්‍යය හා උපකරණ, ඡායා පිටපත් යන්ත්‍ර ආදිය මිලදී ගැනීම, ලොන්ඩ්‍රි සේවාව, වැසිකිළි අලුත්වැඩියා කිරීම ආදී කාර්යයන්වලට අදාළව ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක කළ කාල සීමාව හා ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඉලක්ක කළ කාල සීමාව අතර නොගැලපීම් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව එකතුව රු.මිලියන 42.5 ක් වූ විවිධ මිලදී ගැනීම් සඳහා 2024 ප්‍රසම්පාදන අත්පොතේ 4.1.5 වගන්තිය අනුව ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර, අධීක්ෂණය කර නොතිබුණ බැවින් සැලසුම් කළ කාර්යයන්හි ප්‍රගතිය ඇගයීමටද නොහැකි වී තිබුණි.

(ඇ) පාර්ලිමේන්තුවට අවශ්‍ය පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී ඉතිරිව ඇති ප්‍රමාණයන් සැළකිල්ලට ගෙන නොතිබුණු අතර වාර්ෂික අවශ්‍යතාව නිවැරදිව ඇස්තමේන්තු කිරීම සිදු කර නොතිබුණි.

### 4.3 කළමනාකරණ දුර්වලතා

(අ) ශ්‍රී ලංකා සර්ට් ආයතනය මඟින් සමාලෝචිත වර්ෂයේදී පාර්ලිමේන්තුවේ තොරතුරු හා සයිබර් ආරක්ෂණය සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කර ඇති අතර එහිදී පරීක්ෂා කල කරුණු 56 ක් අතුරින් 46 ක අවදානම ඉහළ මට්ටමක පවතින බවට වාර්තා කර තිබුණි. සයිබර් තාක්ෂණය අවභාවිතා කරමින් ඩිජිටල් පද්ධති වලට අනවසරයෙන්

7

ඇතුළු වී සංවේදී තොරතුරු සොරකම් කිරීම, ආයතනයේ මෙහෙයුම් කටයුතුවලට බාධා පැමිණවීම, වෙබ් අඩවිවල අන්තර්ගතය විකෘති කරමින් ආයතනවල කීර්තිනාමයට හානි කිරීම වැනි අනර්ථ ක්‍රියා සිදුවීමේ යම් අවදානමක් පවතින බැවින් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය .

(ආ) පාර්ලිමේන්තුවට අයත් වාහන 12 ක් වෙන්දේසි කිරීමට නිලධාරීන් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් මඟින් 2025 මැයි 28 දින තීරණය කර තිබුණද මේ දක්වා එම කාර්යය සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) මියගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් කල, සේවයෙන් පහකළ හා සේවය හැර ගිය නිලධාරින්ගෙන් 2025 දෙසැම්බර් 31 දිනට අයවියයුතු ණය ශේෂය රු.3,488,864 ක් වූ අතර ඒ තුළ වර්ෂ 1 ත් 3 ත් අතර අයවියයුතු ණය ශේෂය රු.609,667 ක්ද වර්ෂ 3 ත් 5 ත් අතර අයවියයුතු ණය ශේෂය රු.374,404 ක්ද වර්ෂ 10 කට කාලයක් ඉක්ම වූ වැඩ තහනම් කල නිලධාරින්ගෙන් අයවියයුතු ණය ශේෂය රු.120,120 ක්ද වූ ණය අය කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.4 යහපාලනය

### 4.4.1 විගණන හා කළමනාකරණ කමිටු

අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ ඉටුකිරීම සම්බන්ධයෙන් වන 2025 අප්‍රේල් 28 දිනැති අංක DMA/01/2025 දරන කළමණාකරණ විගණන චක්‍රලේඛයේ 2.2 (i) ඡේදයේ දක්වා ඇති පරිදි සැම කාර්තුවක්ම තුළම එක් රැස්වීමක් වන පරිදි අවම වශයෙන් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම 04 ක් ප්‍රවර්තන වර්ෂයට අදාළව පැවැත්විය යුතු වුවද 2025 වර්ෂයේ රැස්වීම 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 4.6 නොවිසඳුනු විගණන ඡේද

2020, 2021, 2022, 2023 සහ 2024 වර්ෂයන්හි විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවල දැක්වෙන " 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන, වෙළද හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 1.2 ඡේදය හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පාර්ලිමේන්තු මහලේකම් වෙත නිකුත් කර තිබූ, 2019 අප්‍රේල් 25 දිනැති අංක TIP/SS/01/84 දරන ලිපියට අනුව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය වෙත සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් වූ චක්‍රලේඛ විධිවිධාන සහ උපදෙස්වලට පටහැනිව, "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 03 දෙනෙකුට (බලපත්‍රය හිමි තනතුරට අදාල සක්‍රිය සේවා කාලය මාස 02 ත් වර්ෂ 01 ත් අතර) සහනදායි මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම" සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

# 5. මානව සම්පත් කළමණාකරණය

## 5.1 මානව සම්පත් සංවර්ධන සැලැස්ම

2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 5.2 අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 1061 ක් වූ අතර එයින් තනතුරු 192 ක් පුරප්පාඩුව පැවති අතර අනියම් තනතුරු 03 ක් හා වෙනත් තනතුරු 03 ක් ලෙස අනුමත නොවූ තනතුරු 06 ක්ද පැවතුණි.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

| Performance Report - Training Programmes - 2025 - Human Resource Development Office | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **S. No** | **Training Programme** | **No. of Trainees** | **Time Period** | **Total Investment (Rs.)** | | **Nature of the Programme** | **Result/ Knowledge Gained** |
| | | | | **Local** | **Foreign** | | |
| 1 | LCD, LED, Smart TV & Monitor Repairing Course | 2 | 3 months | 56,000.00 | | External Training Programme – Conducted by Microvision Technologies | Two Senior Computer Technicians received training on LED and LCD monitor repair, enabling in-house maintenance and repair of monitors. |
| 2 | Induction | 60 | 1 day | | | Orientation Programme for New Recruits of the Parliament Secretariat | New recruits were familiarized with the organizational structure, departments, procedures, and workplace culture, gaining a general understanding of parliamentary operations, administrative procedures, and employee responsibilities. |
| 3 | Competancy Building | 10 | 3 hours | 17,500.00 | | External Training Programme – Conducted by eSolve Business Solutions | Participants developed soft skills in planning, organizing, communication, and time management. |
| 4 | 8th Knowledge Sharing Session | 55 | 3 hours | | | Internal Workshop Conducted by Officers of the Establishments Office | Participants gained an understanding of the duties and functions of the Establishments Office, including services provided, employee privileges, the code of conduct, and applicable disciplinary procedures. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 5 | International Training Programme in Legislative Drafting - ITEC - India | 2 | 28 days | | | Foreign Training Programme by PRIDE, Lok Sabha, India (ITEC Scholarship Scheme) | Two Assistant Principal Officers received training in Legislative Drafting. |
| 6 | Training Programme for Parliament Telephone Operators | 76 (9 TP Operators+ 14 Receptionists + 45 Parliamentary Officers + 8 Assistant Parliamentary Officers) | 5 days | 50,000.00 | | Training Programme on Open Parliament Concept & Participatory Democracy, RTI Act, Telephone Exchange Procedures & Modern Communication Technology | Telephone Operators received theoretical and practical training on telephone exchange procedures, modern communication technology, and the exchange system used in Parliament. Receptionists, Parliamentary Officers, and Assistant Parliamentary Officers were trained on the Open Parliament concept, Participatory Democracy, the RTI Act and its practical implications, and Telephone Ethics. Participants successfully completed the programme and were awarded certificates. |
| 7 | 9th Knowledge Sharing Session | | 3 hours | | | Internal Workshop Conducted by Officers of the Ministerial Consultative Committee (MCC) Office | Participants gained knowledge of the duties and functions of the MCC Office, including procedures related to MCC meetings, tabling reports in Parliament, and approval of orders and regulations under Acts. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 8 | 10th Knowledge Sharing Session | | 3 hours | | | Internal Workshop Conducted by the Department of Communication – Media & Public Outreach Office | Participants were briefed on the duties and functions of the Department of Communication within Parliament. |
| 9 | Fundamentals of International Law and Security - ITEC - India | 1 | 12 days | | | Foreign Training Programme (ITEC Scholarship Scheme) – International Law & International Relations | A Research Officer received training in International Law and International Relations. |
| 10 | Enhancing Administrative Efficiency and Professionalism - ITEC - India | 1 | 14 days | | | Foreign Training Programme (ITEC Scholarship Scheme) – Effective Administrative Function & Communication | An Assistant Principal Officer enhanced skills in effective administration and communication. |
| 11 | Professional Development Training Programme for X-Ray Inspectors | 15 | 1 Day | 20,000.00 | | Professional Development Programme for Parliament X-ray Operators on Effective Security Measures | Participants enhanced their knowledge of radiation safety and awareness, particularly for operators and inspectors handling baggage scanner X-ray machines, ensuring safer and more effective security operations. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 12 | Outbound Training for Primary Level Staff - Group 1 | 192 | 1 Day | 864,000.00 | | Outbound Training Programme for Primary Level Staff (Salary Groups A, B & C) | Staff participated in team-building activities at CHE Adventure Park, Hanwella, strengthening leadership, communication, conflict resolution, teamwork, and problem-solving skills through structured outdoor activities. |
| 13 | Leadership Workshop for Middle and Senior Management - Inside Edge: Adaptive Leadership for Parliamentary Executives | 50 | 2 days | 934,250.00 | | Leadership Workshop for Senior Management of Parliament | Senior Management participated in a workshop on Ethical Leadership and Integrity, Communication and Interpersonal Skills, Team Management, Motivation, and Conflict and Change Management. |
| 14 | Integrated Cybersecurity for Safer Digital Worlds - Singapore | 1 | 5 days | | | Foreign Training Programme – Singapore Cooperation Programme | The Communication/Security Engineer received training on cybersecurity, cyber threats, cybersecurity governance frameworks, and international best practices. |
| 15 | Data Needs for Planning Sustainable Development - ITEC - India | 1 | 5 days | | | Foreign Training Programme (ITEC Scholarship Scheme) – Data Needs for Planning | A Research Officer enhanced expertise in data analysis and data-driven planning methodologies. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 16 | Workshop on KOHA | 2 | 3 days | | | Training Workshop for Library Staff – Library Management Software | Two Assistant Librarians were trained in the Integrated Library Management System, including acquisition, cataloguing, circulation, and library management functions. |
| 17 | Essential Knowledge and Skills for the Parliament Members and the Staff of CoPA and CoPE | 25 | 2 days | | | Training Workshop for Members and Staff of CoPA, CoPE & NAOSL | Participants gained knowledge on the committee system, the role of NAOSL in financial oversight through CoPA and CoPE, best practices in inquiries, negotiation with government entities, use of technology, cross-party consensus-building, parliamentary privileges, and the role of CIABOC. |
| 18 | Parliamentary Internship Programme for Foreign Parliamentary Officials | 1 | 23 days | | | Foreign Training Programme (ITEC Scholarship Scheme) – Parliamentary Internship Programme (Parliament of India) | An Assistant Parliamentary Officer received training on parliamentary practices and procedures. |
| 19 | Computer Forensics and Cyber Security | 1 | 14 days | | | Foreign Training Programme (ITEC Scholarship Scheme) – Cybersecurity | A Senior Technical Assistant received specialized training in cybersecurity |